# ප්‍රසම්පාදන දැන්වීම ශ්‍රී ලංකා යුද්ධ හමුදාව

## සැපයුම් සදහා නිෂ්පාදකයින්/සැපයුම්කරුවන්/ආනයනකරුවන්/කොන්ත්‍රාත් කරුවන්ගෙන් වෙනත් භාණ්ඩ සදහා ලංසු කැදවීම
## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - 2025 වසර

1 2025 වර්ෂය තුල ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට අයත් පහත සදහන් භාණ්ඩ මිළදී ගැනීම සදහා සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු සදහා යුද්ධ හමුදා ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් මිළගණන් කැදවනු ලැබේ.

අ. තෝරාගත් කොන්ත්‍රාත්කරුවන් විසින් පහත සදහන් භාණ්ඩ මිලදී ගැනීමේ ඇණවුමෙහි සදහන් පරිදි 1 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධොපකරණ බලකාය වෙත ප්‍රවාහනය කර භාරදිය යුතුය.

ආ. මේ සදහා උනන්දුවක් දක්වන සැපයුම්කරුවන් වැඩකරන දිනවලදී උදේ 1000 පැයේ සිට සවස 1500 පැය දක්වා අයිතමය ඉදිරියෙන් දක්වා ඇති දිනයන් තුල අකුරේගොඩ පාර, බත්තරමුල්ල යුද්ධ හමුදා මුලස්ථානයේ පිහිටි යුධොපකරණ සේවා අධ්‍යක්ෂක මණ්ඩලය වෙතින් (යුද්ධ හමුදා රථ වාහන ගාල්කරනු ලබන ස්ථානයේදි) ඒකී ලංසු ලබාගත හැකි අතර එක් එක් ටෙන්ඩර් අංක වෙනුවෙන් දක්වා ඇති ආපසු නොගෙවන අයදුම්පත් ගාස්තු ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ අධ්‍යක්ෂ මුදල්, ශ්‍රී ලංකා යුද්ධ හමුදා මුලස්ථානය, ආරක්ෂක මුලස්ථාන සංකීර්ණය, අකුරේගොඩ පාර, බත්තරමුල්ල වෙත මුදලින් ගෙවිය යුතුය. අයදුම්කරුවන් විසින් නිසි පරිදි අත්සන් කරන ලද ලංසුව නිල මුද්‍රාව තැබීමෙන් පසු ඉදිරිපත් කල යුතුය. ටෙන්ඩර් අඩංගු ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ 2025 වසර (භාණ්ඩ වර්ග) සදහා මිල ඉදිරිපත් කිරීම ටෙන්ඩර් අංකය (යුසේඅම/2025/........) දිනය සහ මිළ ගණන් විවෘත කරනු ලබන වේලාව සලකුණු කළ යුතුය.

### වෙනත් භාණ්ඩ

| අනු අංකය | ටෙන්ඩර් හඳුනාගැනිමේ අංකය | විස්තරය | දේශීය/ විදේශීය | ප්‍රමාණය | | මිලගණන්පත් නිකුත් කරනු ලබන දිනය සහ වේලාව | ලංසු වැසීම හා විවෘත කරනු ලබන දිනය සහ වේලාව | පූර්ව ලංසු කැදවීමේ දිනය සහ වේලාව (ස්ථානය - යුද්ධ හමුදා වාහන ගාල්කරනු ලබන ස්ථානය) | ආපසු නොගෙවන අයදුම්පත් ගාස්තු මුදල රු: |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | යුසේඅම/2025/2508 | Drone Battery | දේශීය | 12 | ගණනින් | 2025/12/05 සිට 2025/12/18 පෙව 1100 | 2025/12/19 - පෙව 1100 | | 1,000.00 |
| 2 | යුසේඅම/2024/2500 | Cyber Security Software/ Tools | දේශීය | 7 | පෙ/වි | 2025/12/05 සිට 2025/12/18 පෙව 1100 | 2025/12/19 - පෙව 1100 | | 3,500.00 |

2 ලංසු තැබීම දක්වා ඇති පරිදි ජාතික තරගකාරී ලංසු තැබීමේ ක්‍රියා පටිපාටිය හරහා සිදුකෙරේ.

3 මුද්‍රා තබන ලද ලංසු පිටපත් දෙකක් ලියාපදිංචි තැපැලෙන් පහත සදහන් ලිපිනයට හෝ එම ලිපිනයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට ලංසු වැසීමේ කාලය අවසන් වීමට පෙර තැම්පත් කළ හැකිය. අදාළ භාරගැනීම් කාලය අවසන් වූ වහාම ලංසු විවෘත වන අතර ප්‍රමාද ලංසු ප්‍රතික්ෂේප කෙරේ. ජාතික හැඳුනුම්පත හා සේවා ස්ථානයේ ලිපියක් සමග ලංසුකරුට හෝ ඔහුගේ නියෝජිතයෙකු හට ලංසු විවෘත කිරීම සදහා සහභාගිවිය හැකිය.

**ප්‍රසම්පාදන කමිටු සභාපති**
**යුද්ධ හමුදා ප්‍රසම්පාදන කමිටුව**
**යුධොපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාව**
**ශ්‍රී ලංකා යුද්ධ හමුදා මුලස්ථානය**
**ආරක්ෂක මුලස්ථාන සංකීර්ණය**
**අකුරේගොඩ පාර**
**බත්තරමුල්ල**

4 ලංසු ඉදිරිපත් කිරීම සදහා සැපයුම්කරුවන් පහත සදහන් සුදුසුකම් සපුරාලිය යුතුය. කාර්මික ඇගයීම් අවස්ථාවේදී අදාළ සුදුසුකම් සලකා බලනු ලැබේ.
අ. මූල්‍ය හැකියාව.
ආ. සතුටුදායක බදු ගෙවීමේ වාර්ථාව
ඇ. ප්‍රමාණවත් නිෂ්පාදන හැකියාව
ඈ. ප්‍රමාණවත් ගබඩා පහසුකම්
ඉ. ප්‍රමාණවත් කාර්යමණ්ඩල නිලධාරීන් හා කාර්යාල පහසුකම්
ඊ. ප්‍රමාණවත් ප්‍රවාහන පහසුකම්
උ. ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ පිටපතක් හෝ පසුගිය වසර තුනක මෙහෙයුම්වාර්ථාව සමග සංස්ථා සහතිකයක්

5 දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවේ වැට් බදු සදහා ලියාපදිංචි වී ඇති ලංසුකරුවන් මිල කැදවීමේ නිවේදනය සමග වැට් බදු සදහා ලියාපදිංචි වී ඇති සහතිකය ඉදිරිපත්කල යුතුය.

6 අසම්පූර්ණ හා අවශ්‍ය ලේඛණ සාක්ෂි සමග නොමැති ලංසු ලේඛණ ප්‍රතික්ෂේප කරනු ලැබේ. දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපති හට ඕනෑම ලංසුවක් පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමටත් මිළදීගනු ලබන ප්‍රමාණයන් තීරණය කිරීමටත් අයිතියක් ඇත.

7 ගිවිසුම් අත්සන් කිරීම සදහා තෝරාගත් ලංසුකරුවන් හට ලියාපදිංචි තැපැලෙන් දැනුම්දෙනු ලැබේ.

8 දේශීය සැපයුම්කරුවන් සදහා පේෂණපත් මගින් ගෙවීම් සිදුකරනු ලබයි.

9 උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට අවැසි වැඩි විස්තර ලබාගැනීම සදහා දුරකථන අංක වෙනත් භාණ්ඩ සදහා - 0114050216 අංශ භාර නිලධාරී වෙතින් ලබාගත හැකිය.

**යුද්ධ හමුදාධිපති**
**ශ්‍රී ලංකා යුද්ධ හමුදා මුලස්ථානය**
**ආරක්ෂක මුලස්ථාන සංකීර්ණය**
**අකුරේගොඩ පාර**
**බත්තරමුල්ල**